# මළිගේ උපකාරය



නෙතුලි තිලකරත්න

# මලීගේ උපකාරය

කතෘ :- නෙතුලි හිමංසා තිලකරත්න

ISBN අංකය :- 978-624-206-893-0

කෘතිය පල කරන දිනය :- 2023/ 11 / 15

කතෘගේ වෙනත් කෘති :- කූඹි රැජින
කපුටු බඩගින්න
දඟකාර මීකී
පාට මොකද්ද
The Queen Ant

# පිදුම

මගේම

ආ අප්පච්චිටත්,

ද අම්මාටත්,

ර මල්ලීටත්,

ණී සමන්මලී

ය ගුරුමැණියන්ටත්

පුද දෙමි

මෙම පොත

සදාදර සිතින් !

# ස්තුතිය

පොත එළිදැක්වීමෙහිලා

මා

හට

උදව් උපකාර

කළ

සැමට

**තුති !**

නෙතුලි තිලකරත්න

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයේ ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුතු බහුවිධ කුසලතාවයන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණ මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛණ කරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂී ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් " **දිවිය දිනන විද්‍යුත් පොතක්** " ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ " **දිවිය දිනන විද්‍යුත් පොතක්** " ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදී ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

.

**ශෂිකලා සේනාධීර**
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023 . 11 . 01

# මල්ලීගේ උපකාරය

කිචි බිචි , කිචි බිචි , කිචි බිචි ,

“කෝ මගේ පැටවුනේ මෙහෙට එන්න.”

ගේ කුරුලු අප්පු කිවුවා.



කිච් බිච් , කිච් බිච්  ගේ කුරුලු පැටවු

එක පෙළට ආවා'



එන්න මගෙ පුතාලා කෑම කන්න.

ගේ කුරුලු හාමිනේ කිව්වා.

“එනවා අම්මේ. මේ අපි එනවා. ”

කුරුලු පැටවු පෝළිමේ ඉඳලා

හොටෙන් ඇන ඇන කෑම කෑවා.



කෑම කාලා ඉවර වෙලා ගිරා පැංචා ගේ කුරුලු ගෙදරට ආවා. මොනර පොඩ්ඩලත් එයාලා එක්ක යාළුයි.



දැන් රෑ වෙලා. කුරුලු පැටවු අම්මාටයි, තාත්තාටයි තුරුලු වෙලා නිදි.



උදේ වුණා.

මලීගේ ගෙදර කුරුලු ලෑල්ලක් හදලා.

“පැටවුනේ , පැටවුනේ .........

මලීගේ ගෙදර කුරුලු ලෑල්ලක් හදලා.”



"අනේ , අම්මේ.......

මලී හොඳ ළමයෙක්. මලී කීකරුයි.

වැඩත් හොඳින් කරනවා."



අපිත් ඒ වගේ වෙන්න ඕනි.

ඔව්. කුරුලු ලෝකෙත් මලී වගේ හොඳ ළමයි ඉන්න එක හරි ම ආඩම්බරයක්.



අපිත් මලී එක්ක යාළු වෙනවා. හොඳ ළමයි සමඟ යාළු වුණාම ඔයාලත් තවත් හොඳ වේවි.




“පුංචි ඔයාලත් හොඳ දේවල්
කළොත් හොඳ දේවල්
ලැබේවි.”



# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාන රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු !

මෙයට
**සෙනවිරත්න මහලේකම්**
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ
2023 . 11 . 01

**ISBN 978-624-206-893-0**